ශ්‍රී ලංකාවේ කර්මාන්ත අංශයේ දීර්ඝකාලීන බලශක්ති විසඳුම් සාකච්ඡා කෙරේ

2022 දෙසැම්බර් 08

විවිධ කර්මාන්තවල නියැලෙන්නන්, සිවිල් සමාජ සංවිධාන, මූල්‍ය සහ අධ්‍යයන අංශයන් හි පුමුඛයින් අද දින පෙරවරුවේ කොළඹදී හමුවී ශ්‍රී ලංකාව මුහුණදෙන අතිශය දරුණු බලශක්ති අර්බුදය හමුවේ අනුගමනය කළ හැකි කෙටිකාලීන සහ දීර්ඝකාලීන බලශක්ති විසඳුම් පිළිබඳව සාකච්ඡා කරන ලදී. ශ්‍රී ලංකාවේ කර්මාන්ත අංශය වැඩි වශයෙන් අධික වියදම් සහගත පොසිල ඉන්ධන භාවිතා කරයි. මෙම සාකච්ඡාවට සහභාගීවී සිටි සියයකට අධික පිරිස, ආර්ථික වශයෙන් ඉතා වැදගත් මෙම අංශය තිරසර බලශක්ති මූලාශයන් සමගින් අනාගතයේ ඉදිරියට ගමන් කළ හැකි ආකාරය පිළිබඳව අදහස් හුවමාරු කරගැනීමටත් ඒ පිළිබඳ ක්ෂේත්‍රයේ ප්‍රවීණයන්ගෙන් අදහස් හා යෝජනා ලබාගැනීමටත් මෙහිදී සමත්විය.

“ශ්‍රී ලංකාවේ කර්මාන්ත සංවර්ධනය ආනයනික පොසිල ඉන්ධන භාවිතයෙන් ඉවත් කිරීම සමගින් අපට අනාගතයේ බලශක්ති අර්බුදයන් ඇතිවීම වළක්වා ගැනීමට සහ ලෝකයේ දේශගුණ විපර්යාස ඇතිවීමේ වේගය පහල දැමීමටත් හැකිවනු ඇති බව” පරිසර අමාත්‍ය ගරු නසීර් අහමඩ් මහතා තම ආරම්භ දේශනයේදී පවසා සිටියේය. කර්මාන්ත අමාත්‍ය වෛද්‍ය රමේෂ් පතිරණ මහතා අදහස් දක්වමින් “කර්මාන්ත අංශය ජාතික ශ්‍රමබලකායන් 30% කට රැකියා අවස්ථාවන් සලසාදෙන අතර එබැවින් මෙම අංශය ස්ථාවර කිරීම ඉතා වැදගත්වේ” යැයි පැවසීය.

යුරෝපා සංගමය විසින් මූල්‍ය අනුග්‍රහය දක්වන ලංකාවේ කර්මාන්ත ක්ෂේත්‍රයේ දේශගුණික විපර්යාස සඳහා වන බලපෑම අවම කිරීමේ ව්‍යාපෘතිය Accelerating Industries' Climate Response in Sri Lanka' (AICRSL) project විසින් සංවිධානය කරන ලද මෙම අවස්ථාවේ වැදගත්ම අංගය වුයේ බලශක්ති අංශයේ ප්‍රවීනයන් සහ නවෝත්පාදකයින් සමගින් පැවැති විද්වත් මණ්ඩල සාකච්ඡාවයි. සීග්‍රයෙන් වෙනස්වන ලෝකයක මූල්‍ය, නව තාක්ෂණයන් සහ අන්තර්ජාතික වෙළඳාම පිළිබඳ මහත් අත්දැකීම් සමගින් මෙම විද්වත් මණ්ඩලය තිරසර කර්මාන්ත බලශක්ති ක්ෂේත්‍රයේ නවතම සංවර්ධනයන් පිළිබඳව අදහස් දැක්වූහ.

මෙම අවස්ථාවේදී අදහස් දක්වමින් ශ්‍රී ලංකාව සහ මාලදිවයින් සඳහා වූ යුරෝපා සංගමයේ තානාපති ගරු ඩෙනිස් චයිබි මහතා “දේශගුණ විපර්යාස අවම කිරීමට දායකවන අතරම කාබන් විමෝචනය අඩු නිෂ්පාදනයන් වැඩිවශයෙන් ඉල්ලා සිටීමේ ප්‍රවනතාවයක් ගෝලීය වෙළඳපලේ දක්නට ඇති බවත් ඒ අනුව තිරසර වශයෙන් නිෂ්පාදිත භාණ්ඩ වෙළඳපල වෙත පිවිසීමට ඉඩප්‍රස්ථා සැලසීම මගින් ශ්‍රී ලංකාවට ආර්ථික ප්‍රතිලාභ අත්කරදීමට අපි ඉතා උනන්දුවෙන් කටයුතු කරනවා” යැයි පැවසීය. මෙය යුරෝපා සංගමයේ හරිත වැඩපිළිවෙලේ තවත් එක් දිශානතියක් වන අතර අපගේ අභිප්‍රාය වන්නේ තිරසර බලශක්තියෙන් යුත් අනාගතයක් සුරක්ෂිත කරගැනීමයි.

මේ අතර බලශක්ති භාවිතය වැඩි දියුණු කිරීමට දැනටමත් උපකාර කරන කර්මාන්ත අංශයේ සහ රජයේ ශ්‍රී ලංකාවේ බලශක්තිය සුරක්ෂිත කරන්නන් බලශක්තිය සුරැකීම පිළිබඳ ප්‍රදර්ශනයක් මෙයට සමගාමීව පවත්වන ලදී. මෙම අංශය පිළිබඳ උනන්දුවක් දක්වන අනෙකත් පිරිස හඳුනාගන්නා ලෙසත් ඔවුන් විසින් දරන ප්‍රයත්නයන් අගය කිරීමටත්, මෙවැනි ක්‍රියාමාර්ග ගැනීමට අනෙක් අය පෙළඹවීමටත් මෙමගින් හැකිවේ.

“සෑම පරිනාමත්මක කතාපුවතකම අභියෝගයන් බාරගන්නා මිනිසුන්, ඒ අභියෝගය සමගින් කටයුතු කිරීම සහ වෙනසක් ඇතිකරන පුද්ගලයින් අවශ්‍ය වේ. ශ්‍රී ලංකාවේ බලශක්තිය සුරකින්නන් අතිශයින්ම මෙවැනි පිරිසක් වේ. කර්මාන්ත අංශයේ ධෛර්ය සම්පන්න ප්‍රමුඛයින් සහ බලශක්තිය සුරක්ෂිත කරන්නන් ශ්‍රී ලංකාවේ කර්මාන්ත ක්ෂේත්‍රයේ බලශක්තිය අපතේ යාම සහ හරිතාගාර වායුව නිකුත්වීම අඩු කිරීමටත් සහාය දැක්වීමට තීරණය කර තිබේ. මෙම ක්ෂේත්‍රයේ නව වැඩි දියුණුව සමගින් බලශක්තිය සුරක්ෂිත කරන්නන් තවතවත් බිහිවනු ඇතැයි” මම අපේක්ෂා කරනවා යැයි එක්සත් ජාතීන්ගේ කර්මාන්ත සංවර්ධන සංවිධානයේ (UNIDO) ව්‍යාපෘති කළමනාකරු නිකොලස් ඩෙහාඩ් පැවසීය.

ශ්‍රී ලංකා රජය, යුරෝපා සංගමය සහ එක්සත් ජාතීන්ගේ කර්මාන්ත සංවර්ධන සංවිධානය අතර පවත්නා රුපියල් බිලියන 2.8 (€7.56-million) පාර්ශවකරණයක් වන මෙම ව්‍යාපෘතිය මගින් සංවිධානය කරනු ලබන කර්මාන්ත ක්ෂේත්‍රයේ වත්මන් බලශක්ති අර්බුදයේ අභියෝග සහ අවස්ථා මැයෙන් පැවැත්වෙන විද්වත් සංවාද මාලාවේ පළමුවැන්න මෙය වේ. රටේ කර්මාන්ත අංශයට සහාය වීමටත් 2030 වසර වන විට හරිතාගාර වායු විමෝචනය සියයට 7 කින් අඩු කිරීම සඳහා මෙම ප්‍රයත්නය සැලසුම් කර තිබේ. සූර්යබලශක්තිය සහ ජීවවායුව වැනි පුනර්ජනනීය බලශක්ති වැඩිවශයෙන් භවිතා කිරීම හා බලශක්ති කාර්යක්ෂමතාවය වැඩි දියුණු කිරීම ආදිය මගින් කර්මාන්ත අංශයට සහාය දැක්වීමෙන් මෙම අරමුණු දිනාගැනීමට සැලසුම් කර තිබේ.

මෙම පස් අවුරුදු ව්‍යාපෘතිය ක්ෂේත්‍ර ගණනාවක් හරහා ක්‍රියාත්මකවන අතර ඒවාට මිණුම්කරණය, වාර්තා කිරීම සහ හරිතාගාර වායු විමෝචන වලංගුතාවය පරීක්ෂා කිරීම සහ කාබන් භාවිතය අඩු තාක්ෂණයන් භාවිතා කිරීම සඳහා කර්මාන්ත වලට සහාය වීමේ ප්‍රතිපත්ති සැකසීම් මෙයට ඇතුළත් වේ. කර්මාන්ත කළමනාකරුවන් සහ සේවා සපයන්නන් සියගණනක් පුනර්ජනනීය බලශක්තිය සහ බලශක්කි කාර්යක්ෂමතාවය පිළිබඳව මෙමගින් ප්‍රවීණත්වයක් ලබාගන්නා අතර අඩු කාබන් විමෝචනයක් පවත්නා තාක්ෂණයන් වෙත ඔවුන් වැඩි වශයෙන් යොමුවනු ඇත. කර්මාන්ත ක්ෂේත්‍රයේ වත්මන් බලශක්ති අර්බුදයේ අභියෝග සහ අවස්ථා මැයෙන් පැවැත්වෙන විද්වත් සංවාද සහ වෙනත් වැඩසටහන් මෙම ව්‍යාපෘතිය පුරා ක්‍රියාත්මක කරනු ලබන අතර එමගින් රජයට, ව්‍යාපාරික ප්‍රජාවට, මූල්‍ය අංශයට සහ සිවිල් සමාජයට අඩු කාබන් විමෝචනයක් සහිත අනාගතයක් සැකසීමට අවශ්‍ය තාක්ෂණික දැනුම, නවෝත්පාදනයන් සහ විසඳුම් ලබගැනීමට මෙමගින් හැකිවනු ඇත.

ව්‍යෘපෘති කියාකාරකම් පිළිබඳ වැඩිදුර තොරතුරු සඳහා කරුණාකර පහත වෙබ් අඩවියට පිවිසෙන්න
www.industriesclimateresponse.com

නිමාව

සංස්කාරකවරුන් සඳහා සටහන

- වර්තමානය වනවිට ශ්‍රී ලංකාවේ බලශක්ති ක්ෂේත්‍රය ආනයනය කරන පොසිල ඉන්ධන මත දැඩි ලෙස රඳා පවතී. 2019 දී රටේ බලශක්තියෙන් අඩකට වඩා ආනයනය කරන ලෙද ඉන්ධන සහ විදුලිය මගින් නිෂ්පාදනය කරන ලදී. මෙම පොසිල ඉන්ධන මත රඳා පැවතීම මගින් ගෝලීය බලශක්ති අර්බුදයේ දරුණුතම බලපෑම්වලට යටත්වීමට අප රටට සිදුවී ඇත. 2022 වසරේ මුල් කාලයේ දී අනපේක්ෂිත ලෙස ඇති වූ පෙට්‍රල් හිඟය ශ්‍රී ලංකාවේ සියලුම අංශ අඩපණ කළ අතර බලශක්ති පිරිවැය ඉහළ යාම ගෘහස්ත හා ව්‍යාපාර සඳහා මූල්‍ය දුෂ්කරතා ඇති කරයි.

- ශ්‍රී ලංකාවේ කර්මාන්ත උත්තේජන කාලගුණ ප්‍රතිචාර දැක්වීම ශ්‍රී ලංකා ව්‍යාපෘතිය (Accelerating Industries' Climate Response in Sri Lanka' (AICRSL) project) පරිසර, කර්මාන්ත, බලශක්ති සහ බලශක්ති අමාත්‍යාංශ විසින් මෙහෙයවන පස් අවුරුදු වැඩසටහනකි. මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනු ලබන්නේ එක්සත් ජාතීන්ගේ කාර්මික සංවර්ධන සංවිධානය විසින් වන අතර ගෝලීය දේශගුණික විපර්යාස සන්ධානය යටතේ යුරෝපීය සංගමය විසින් එයට අරමුදල් සපයනු ලැබේ. ක්‍රියාකාරී කමිටු ගණනාවක් හරහා අපි ප්‍රධාන රාජ්‍ය ආයතන මෙන්ම කාර්මික හා මූල්‍ය අංශ, ශාස්ත්‍රීය සහ සිවිල් සමාජයේ ප්‍රමුඛ විශේෂඥයින් සහ සංවිධාන ද මෙයට සම්බන්ධ කර ගනිමු.

- එක්සත් ජාතීන්ගේ කාර්මික සංවර්ධන සංවිධානය (UNIDO) යනු දරිද්‍රතාවය අඩු කිරීම, සියලුදෙනා අන්තර්කරණය වූ ගෝලීයකරණය සහ පාරිසරික තිරසරභාවය සඳහා කාර්මික සංවර්ධනය ප්‍රවර්ධනය කිරීම සඳහා වූ එක්සත් ජාතීන්ගේ විශේෂිත ආයතනයකි. United Nations Industrial Development Organization (UNIDO) UNIDO හි මෙහෙවර වන්නේ තිරසර සංවර්ධන ඉලක්ක (SDGs) සාක්ෂාත් කර ගැනීම සඳහා දායක වෙමින් අන්තර්කරණය සහ තිරසාර කාර්මික සංවර්ධනය ප්‍රවර්ධනය කිරීම සහ වේගවත් කිරීමයි. එක්සත් ජාතීන්ගේ කාර්මික සංවර්ධන සංවිධානය (UNIDO) | www.unido.org.

For further information, please contact:

- Dishnika Perera, Communications Specialist - Small World Stories (on behalf of UNIDO), AICRSL Project, email: dishnika@smallworldstories.org
- Le-Anne Fernando, Political, Press and Information Section, Delegation of the European Union to Sri Lanka and the Maldives, Email: Le-Anne.FERNANDO@eeas.europa.eu, Tel: + 94 11 2674413-4